# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1836/33 - 2013 නොවැම්බර් මස 14 වැනි බ්‍රහස්පතින්දා - 2013.11.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

උක්ත ශීර්ෂය යටතේ ම විසින් 2013 සැප්තැම්බර් මස 10 වැනි දින අංක 1827/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* 09-1042 යටතේ පළ කරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ දැන්වීම පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*මගේ යොමු අංකය* : 150/4/2/1/3.
*ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය* : LD/05/2007 /WS/28.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

***ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :***

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගල්බොඩ කෝරළේ (බටහිර) සුළු කොට්ඨාසයේ, අරම (මාඔයෙන් නැගෙනහිර) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් 2013.06.11 දිනැතිව, මැන සකස් කරන ලද අංක කෑ. 3438 දරන මූලික පිඹුරේ කැබලි අංක 1 හා 2 වශයෙන් දැක්වෙන "අරම වත්ත *නොහොත්* අක්කර වත්ත" නැමති ඉඩමෙන් මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0227ක් පමණ වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස් දෙක:

**කැබලි අංක 1**

**ඉඩමේ නම: අරම වත්ත *නොහොත්* අක්කර වත්ත; ප්‍රමාණය: හෙක්. 0.0057;**

මායිම් :

*උතුරට*: ඇල; *නැගෙනහිරට*: ඇල; *දකුණට*: මූලික පිඹුරු අංක කෑ 769හි කැබලි අංක 1; *බටහිරට*: මූලික පිඹුරු අංක කෑ 769හි කැබලි අංක 1.

හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය: ජේ. වයි. එම්. ගුණදාස බණ්ඩා මහතා, අරම, අරණායක

**කැබලි අංක 2**

**ඉඩමේ නම: අරම වත්ත *නොහොත්* අක්කර වත්ත; ප්‍රමාණය: හෙක්. 0.0170;**

මායිම් :

*උතුරට*: ඇල; *නැගෙනහිරට*: මූලික පිඹුරු අංක 769 හි කැබලි අංක 1; *දකුණට*: මූලික පිඹුරු අංක කෑ 769හි කැබලි අංක 1; *බටහිරට*: මූලික පිඹුරු අංක කෑ 769හි කැබලි අංක 1.

හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය: ජේ. වයි. එම්. ගුණදාස බණ්ඩා මහතා, අරම, අරණායක

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2014 ජනවාරි මස 15 වැනි දින පෙ.ව. 11.30 ට අරණායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2014 ජනවාරි මස 08 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ



*මෙම ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය, පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

අනුර රාජරත්න,
ප්‍රාදේශීය ලේකම්,
අරණායක.

2013 නොවැම්බර් මස 11 වැනි දින,
අරණායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

11– 970

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : අත්/කේඩී/105/ඊඩී.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන *ඉඩම/පරවශ්‍යතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

***ලබා ගැනීමට බලාපොරොත්තු වන *ඉඩම/පරවශ්‍යතාවේ විස්තර :***

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හේවාගම් කෝරළය සුළු කොට්ඨාසයේ, මාළඹේ ගමේ, 456ඒ මාළඹේ බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පිහිටි කොළඹ දිස්ත්‍රික් මැණුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද මූලික පිඹුරු අංක කො. 9134හි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.2362ක් පමණ වූ පහත විස්තර කරන ඉඩම් කැබලි දෙක:

**මූලික පිඹුරු අංක: කො. 9134හි කැබලි අංක 01 හා 02**

01. **කැබලි අංක 1**

ඉඩමේ නම: හික්ගහවත්ත; වර්තමාන ඉඩම් පරිහරණය: මාර්ගය: හිමිකම්පාන්නා: රජය: මුල් හිමිකම්පාන්නා: ද ෆිනෑන්ස් පුද්ගලික සමාගම, අංක 7ඒ, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07; ප්‍රමාණය: හෙක්. 0.0331;

02. **කැබලි අංක 2**

ඉඩමේ නම: හික්ගහවත්ත; වර්තමාන ඉඩම් පරිහරණය: ක්‍රීඩා පිටිය: හිමිකම්පාන්නා: රජය: මුල් හිමිකම්පාන්නා: ද ෆිනෑන්ස් පුද්ගලික සමාගම, අංක 7ඒ, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07; ප්‍රමාණය: හෙක්. 0.2031;

ඉහත සඳහන් *ඉඩම/පරවශ්‍යතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2013 දෙසැම්බර් මස 26 වැනි දින පෙ.ව. 10.00 ට කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2013 දෙසැම්බර් මස 19 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී *ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

එම්. එස්. පී. සූරියප්පෙරුම,
ප්‍රාදේශීය ලේකම්,
කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

2013 නොවැම්බර් මස 12 වැනි දින,
කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

11– 1049

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.